# භූගෝල විද්‍යාව II පත්‍රය (පිළිතුරු)

01. i. ශක්තිය හා පදාර්ථ (2)

ii. හුදෙකලා, විවෘත, ආවෘත (5)

iii. පරිවර්ති, අපරිවර්ති, මෙසෝ, තාප ගෝලය

නම් කිරීමට 2 යි.

විස්තරයට 3 යි. (5)

iv.

- හරිතාගාර වායු විමෝචනය

පොසිල ඉන්ධන දහනය (ගල් අඟුරු තෙල්, ස්වභාවික වායු) $co_2$ හා අනෙකුත් හරිතාගාර වායු මුදාහැරීම, ගෝලීය උණුසුම වෙනස්වන කාළගුණික රටා)

- ඕසෝන් ක්ෂය වීම.

ඕසෝන් ක්ෂය වන ද්‍රව්‍ය භාවිතය (C,F C හැලෝන්)
ඕසෝන් ස්ථරය ක්ෂය වීම පාරජම්බුල කිරණ වැඩි වීම.
සෞඛ්‍ය අවදානම

- වායු දූෂණය

කාර්මික කෘෂිකාර්මික හා ප්‍රවාහනය මගින් දූෂක මුදා හැරීම.
$SO_2$ $NO_x$ නයිට්‍රජන් ඔක්සයිඩ් වාෂ්පශීලි කාබනික සංයෝග විමෝචනය කිරිම.
වනහරණය හා ගිනි තැබීම නිසා වායුගෝලය දූෂණය වීම.
කාර්මීකරණය, පොසිල දහනය මගින් වායුගෝලය දූෂණය වීම.
කෘෂි රසායන ද්‍රව්‍ය නිසා පරිසරයට එක්වීම.
සත්ව පාලනයේ දී වමාරාකන සතුන් විසින් මීතේන් වායු විමෝචනය

2.5 x 2

(5)

v. වායුගෝලයෙන් 5000m දක්වා

ශිලාගෝලයෙන් 2.5 m (ශාකයක මුල් විහිදෙන බැක්ටීරියා ක්‍රියාකාරිත්වයෙන් යුත්)

ජලගෝලයෙන් සාගර පත්ල දක්වා ප්‍රභාසංස්ලේෂණයට හිරු එළිය ලැබෙන සීමාව

සීමාව දැක්වීමට (1)

- ක්‍රියාමාර්ග

i. රැක්රෝපණය

ii. ජල මූලාශ්‍ර ආරක්ෂා කිරිම.

iii. පොදු ප්‍රවාහන භාවිතය

iv. කෘෂි රසායන භාවිතය අවම කිරිම (ජෛන්දීය පොහොර භාවිතය)

v. විධිමත් කසල බැහැරකරණය

vi. අවිධිමත් පතල් කැණීම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

vi. සම්පත් භාවිතයේ දී 3 R සංකල්පය ක්‍රියාත්මක කිරිම.

(මින් කරුණු 2 ක් පැහැදිලි කිරිමට 4)

(5)

02. 1. i. සමපීඩන බල හා චලන

ii. ආතතීය බල හා චලන

2. 

අභිසාරි අපසාරි තීර්යක්

මේ එක් එක් තැටි මායිම් පිළිබඳ විස්තර කිරිම.

රූපසටහන් ඇසුරින් නම් කිරිමට - 3

විස්තරයට - 3

(6)

3. සමපීඩන බල හා චලන මගින් නැමි කඳු නිර්මාණය වේ.

සමමිතික, අසමමිතික, ඒකානති, සමානති, ඔත් බැම්ම උලැගි නැම්ම මෙම රූප රූපසටහන් මගින් විස්තර කිරිම අවශ්‍යයි.

රූපසටහනට - 1/2

විස්තරයට - 1/2

3 x 2

(6)

4. 1. පරි පැසිෆික් කලාපය (තැටිකිදා බහින)

2. මධ්‍යධරණී මුහුදු ප්‍රදේශය

3. මධ්‍යම සාගරික වැටි ආශ්‍රිත කලාපය

4. අප්‍රිකානු සුවිභේද නිම්න කලාපය නම් කිරිමට - 2

- අළු කේතු

- පලිහ
- කල්දේරා
- සංයුක්ත කොත (ශිඛරය)

මේවා රූප සටහන් මගින් විස්තර කිරීම.

රූපසටහනට - 1/2

විස්තරයට - 1 1/2

2 x 2

(6)

03. 1. මව් පාෂණය ජීරණය වීමෙන් පස නිර්මාණය වේ.
දීර්ඝ කාලයක් තුළ පාංශු ජනක ක්‍රියාවලයට භාජනය වීමෙන් පස තුනීතට්ටුවක් ලෙස මතුපිට නිර්මාණය වේ. (2)

2. මව් පාෂාණය
දේශගුණය
භූ විෂමතාව
කාලය
ශාකවල සනත්වයන්ගේ හා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය
ජලය හා ජල වහනය

2 x 3

(6)

3.

O,A,B,C,R යනුවෙන් ප්‍රධාන මහල් කලාප 05 කි.

O කලාපය (O කලාපය)

- තුනී ස්තරයකි.
- පස මතුපිට වැටෙන ජීරණය වූ හෝ ජීරණය වෙමින් පවතින කාබනික කොටස් පවතී.
- ජීරණය වූ කාබනික ද්‍රව්‍ය මෙහි පහල කොටසේ පවති.

A කලාපය (මහළ)

- O කලාපයට යටින් මෙම කලාපය පිහිටා ඇත.

- කාබනික ද්‍රව්‍ය වියෝජනයෙන් ඛනිජ ද්‍රව්‍ය පසට එකතු වේ.
- පාංශු ජීවීන් බහුලය.
- පස මතුපිට වර්ෂණය මගින් ලැබෙන ජලය නිසා ඛනිජ පසෙන් පහළට ක්ෂරණය වේ.
- ක්ෂරණය වූ කලාපයකි.

B කලාපය (මහළ)

- ක්ෂරණය වූ ඛනිජ පෝෂක තැන්පත් වන කලාපය
- පෝෂිත කලාපයකි.
- Fe, AL වැනි ඛනිජ බහුලය.
- A මහලට වඩා පැහැදිලිය.

C කලාපය (මහළ)

- පාෂාණ ජීරණයෙන් ලැබුන මව් පාෂාණ ද්‍රව්‍ය අඩංගු වේ.
- එය ඒකාබද්ධ නොවූ පාංශු කොටස් වලින් යුක්තයි.
- භූගත ජලය එම ස්ථරයේ දක්නට ලැබේ.
- විශාල ගස්වල මුල් මෙම ස්තරයේ දක්නට ලැබේ.
- මෙම මහළට යටින් ජීරණය නොවූ මව් පාෂාණය දක්නට ලැබේ.

R කලාපය (මහළ)

- මව් පාෂාණ තට්ටුවය.
- පසට යටින් තද පාෂාණ ස්තරයකි.
- ග්‍රැනයිට්, බැයෝල්ට්, ක්වාට්ස් සහ වැලිගල් වැනි පාෂාණ උදාහරණ වේ.
- කාබනික ද්‍රව්‍ය නොමැත.

රූප සටහනට 2

විස්තරයට 4

(6)

4.

- පසට හිතකර බෝග වගාවන් වගා කිරිම.
- වනාන්තර ප්‍රතිරෝපණය
- ඛාදනයට ලක්වන ප්‍රදේශ වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග (කාණු කැපීම, ගල්වැටි) ගැනීම.
- භූමි පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කිරිම.
- ඓන්ද්‍රීය පොහොර භාවිතය

- අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම. 3 x 2

(6)

04. 1. කාලගුණය යනු වායුගෝලයේ කෙටි කාලීන ස්වභාවයයි. එනම් පැය 24 ක් වැනි කාලයක් තුල පවතින තත්ත්වය වන අතර එය මිනිත්තුවෙන් මිනිත්තුවට පැයෙන් පැයට දෛනිකව වෙනස් වේ.

දේශගුණය යනු අවු. 30 ක් තරම් දීර්ඝ කාලයක් තුල වායුගෝලයේ පැවතීමෙන් තහවුරු වූ හෙවත් සාමාන්‍ය බවට පත්වූ තත්ත්වයයි.

2. i. ගෝලීය සාධක හා කලාපීය සාධක (global and zonal factors)

ii. ප්‍රාදේශීය සාධක (ඉන්දියානු උපමහද්වීපයේ බලපෑම) (regional factors)

iii. ස්ථානීය සාධක (Local factors)

ඉන්දියන් සාගරයේ බලපෑම

- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ දූපතක්ව පිහිටීම නිසා ජලවාෂ්ප සහිත සුළං ධාරාවල බලපෑමට ලක්වන බව
- එය දිවයිනට ආකාර 2 ක් මගින් (නිරිතදිග/ඊසානදිග) බලපාන ආකාරය
- බෙංගාල බොක්කේ අඩුපීඩන කලාපය සුළංධාරා කෙරේ බලපෑ ආකාරය
- වර්ෂාපතනය ඇතිවීමටත්, උෂ්ණත්වය ලැබීමටත් බලපා ඇති බව

(6)

3.

- පොසිල දහනය
  මිනිසා විසින් ගල් අඟුරු, ඛනිජ තෙල් හා ස්වභාවික වායු වැනි පොසිල ඉන්ධන දහනය කිරීම මගින් හරිතාගාර වායු එකතු වීම. පොසිල ඉන්ධන දහනය කිරීම මගින් මේ මගින් නයිට්‍රස් ඔක්සයිඩ් වැඩි වේ. ඉන්ධන දහනය නිසා වායුගෝලයේ $CO_2$ ප්‍රමාණය 30% කින් වර්ධනය වී ඇත.

- කාර්මීකරණය
  මේ මගින්ද හරිතාගාර වායු රාශියක් වායුගෝලයට මුදා හැරේ. නයිට්‍රස් ඔක්සයිඩ් ($N_2$) කාබන්ඩයොක්සයිඩ් $CO_2$ මීතේන් $CH_{-4}$ හයිඩ්‍රෝෆ්ලෝරෝ කාබන් ($HFC_5$) සල්ෆර් හෙක්සාෆ්ලෝරයිඩ් ($SF_6$) නයිට්‍රජන් ෆ්ලෝරයිඩ්, ($NF_3$) වැනි වායූන් ප්‍රධාන වේ. සමස්ථ හරිතාගාර වායුමෝචනයෙන් 19% ක්ම කර්මාන්ත දායකත්වය සපයයි.

- කෘෂිකර්මාන්තය

කෘෂිකාර්මික ක්‍රියාවලියේ දී $CO_2$ වැනි හරිතාගාර වායූන් එකතු වීම. කෘෂිකාර්මික කටයුතු වලදී නිකුත්වන නයිට්‍රජන් ඔක්සයිඩ්වල ආයු කාලය වසර 150 ක් පමන වේ. ඒවා රසායනික පොහොර නිෂ්පාදනයේ දී විමෝචනය වේ. එය ගෝලීය උණුසුම ඉහළ යාමට ඉමහත් දායකත්වයක් දක්වයි.

- සත්ත්ව පාලනය

ගෝලීය හරිතාගාර වායු විමෝචනයෙන් 14.5% පමණ අගයකින් දායක වේ. සත්ව පාලනයේ ද මීතේන් නිපද වේ. වමාරා කන සතුන් මගින් නිකුත්වන මීතේන් $CO_2$ වලට වඩා ආයු කාලය අඩු වුවද ගෝලය උණුසුම් කිරීමට 28 ගුණයකින් දායක වේ. සත්ව අපද්‍රව්‍ය වන මුත්‍රා නිසාද මීතේන් වායුව නිකුත් වේ.

- වන විනාශය

වනාන්තර විනාශ කිරීම හා ජෛව ස්කන්ධ ගිනි තැබීම හරිතාගාර වායු විමෝචනයට විශාල දායකත්වයෙන් සපයයි. වර්තමානයේ සිදුකර ඇති ඇස්තමේන්තුවට අනුව වනාන්තරවල පවතින කාබන් ප්‍රමාණය හෙක්ටයාර එකකට මෙ.ටො. 250 කි. වන විනාශය නිසා ශාක මගින් $CO_2$ අවශෝෂණය කිරීමේ හැකියාව නැති වී යාම නිසා ගෝලීය උණුසුම ඉහල යාම තීව්‍ර වේ.

2 x 3

(6)

4. ස්වභාවිකව සිදුවන ගෝලීය උණුසම නිසා

සෞරග්‍රහ මණ්ඩලයේ ඉතා දීර්ඝ කාල පරාසයන් තුල සිදුවන වෙනස්කම් අනුව සූර්යා වටා භ්‍රමණය වන කක්ෂයේ දී වෙනස්වීම් ඇති වේ. සූර්යයා හා පෘථිවිය අතර වඩාත් දුරස්ථ කක්ෂය සහිත යුගවලද පෘථිවියේ උෂ්ණත්වය අඩු වී හිම මිදෙන යුගය (ග්ලැසියර) , සූර්යයාට වඩාත් සමීප කක්ෂය සහිත යුගවල පෘථිවියේ උෂ්ණත්වය වැඩි වී හිම දියවන (අන්තර් ග්ලැසියර යුගයක් ඇති වේ. දැන් පවතින්නේ පෘථිවියේ හිම දියවන හෙවත් ක්‍රමයෙන් උෂ්ණත්වය වැඩිවන ප්‍රවණතාවය කරා ගමන් කරන යුගයයි.

- හිරු ලප
- යමහල් ක්‍රියාකාරිත්වය
- සාගර මතුපිට උෂ්ණත්ව වෙනස්වීම්
- එල්නිනෝ සංසිද්ධිය
- ලානිනා
- ලැව්ගිනි

2 x 3

(6)

## මානුෂ භූගෝල විද්‍යාව

5. 1.

$$P = B - D \pm M$$

ජන සංඛ්‍යාව = උපත් - මරණ ± සංක්‍රමණ

(2)

2.

- දීර්ඝ කාලයක් තුළ සිදු වූ මන්දගාමී වර්ධන අවධිය
  (මානවයාගේ ආරම්භයේ සිට ක්‍රි.ව. 1750 දක්වා)
- ඉතා කෙටි කාලයක් තුල සිදු වූ ශීඝ්‍ර වර්ධන අවධිය
  (ක්‍රි.ව. 1750 - වර්තමානය තෙක්)

i. ජන සංඛ්‍යාව අඛණ්ඩව සෙමින් වර්ධනය වන බව

ii. දෙගුණයක් වීමට ගතවන කාලය කෙටි වන බව

iii. ජන සංඛ්‍යාව බිලියනයෙන් බිලියනය වර්ධනය වීමට ගත වූ කාලය ක්‍රමයෙන් අඩු වීම.

iv. ක්‍රි.ව. 1950 න් පසු කාල පරිච්ඡේදය තුල සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනය වඩා වේගවත්ව සිදුවීම.

v. පස්වන බිලියනයෙන් පසු ජන සංඛ්‍යා වර්ධනය ස්ථාවර තත්ත්වයට පත්වෙමින් පවතින බව

vi. ප්‍රසාරණ අවස්ථාවේ පසු වූ ඇතැම් රටවල ජනගහනය ස්ථාවර අවස්ථාවට ලගාවෙන බව

නම් කිරිමට 2

විස්තරයට 2 x 2

(6)

3. ප්‍රාථමික පිරමීඩය

- දෙපස අවතල හැඩයක් ගනී.
- ළමා ජනගහනය (උපත් අනුපාතිකය) ඉහලය.
- ජන සංඛ්‍යාවෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් වයස අවු. 15 ට අඩු අය වේ.
- අධික මරණ අනුපාතිකයක් දක්වයි.

- අඩු ජීවිත අපේක්ෂාවක් පෙන්නුම් කරයි.
- අවු. 65 ට වැඩි අය 3% කට ආසන්න වේ.
- Ex - කෙන්යාව

ප්‍රසාරණ පිරමීඩය

- දෙපස ඒකාකාර හැඩයකින් යුත් පුළුල් පැතිරුන හැඩයකි.
- පත්ල (ළමා ජනගහනය) ඉතා පුළුල්ය.
- ඉහල උපත් අනුපාතිකයක් සහිත පහළ බසින මරණ අනුපාතිකයක් දක්වයි.
- මැදි වයසේ ජන සංඛ්‍යාව ඉහල අගයක් ගනී.
- ජීවිත අපේක්ෂාව මදක් දිගු වේ.
- Ex - ඉන්දියාව

ස්ථාවර පිරමීඩය

- සියලුම වයස් කාණ්ඩවල ජන සංඛ්‍යාව හෝ ප්‍රතිශතය බොහෝදුරට සමාන වේ.
- මරණ අනුපාතය ඉතා පහළ මට්ටමක පවතී.
- ජන සංඛ්‍යාවෙන් වැඩි කොටසක් දිගු වයස් කාලයක් ගත කරයි.
- වර්ධන වේගය ස්ථාවර තත්වයකට පත්වෙමින් පවතී.
- Ex - ආජන්ටිනාව

හැකිළුණු පිරමීඩය

- අවු. 15 ට අඩු අය සුළුවෙති.
- පසු ප්‍රජනන (65 ට වැඩි) වයස් කාණ්ඩයට අයත් අය සාපේක්ෂව වැඩිය.
- පහල උපත් අනුපාතිකයක්, පහළ බසින මරණ අනුපාතිකයක් සමග දිගු ජීවිත අපේක්ෂාවකින් යුක්තයි.
- Ex - ස්වීඩනය

රූප සටහනට 1/2

විස්තරයට 1 1/2

2 x 3

(6)

4.

- වියපත් අය සඳහා රජය විසින් දරණ පිරිවැය ඉහල යාම.
  (සෞඛ්‍ය, පෝෂණය හා රැකවරණය සඳහා)
- ආයෝජනයට බාධාකාරි ලෙස ඉතිරි කිරිම් අඩු වේ. වියපත් වූවාන් මූලික වශයෙන් නිෂ්පාදකයින්ට වඩා පාරිභෝගිකයන් බැවින් ඉතිරි කිරිම් අඩු වේ.
- බාල වයස්කරුවන් අඩු නිසා ශ්‍රම බලකායට එක්වන සංඛ්‍යාව අඩු වේ. (ශ්‍රම බලකාය අඛණ්ඩව හැකිලීමට ලක්වේ.)
- වියපත් වූවන්ට අවශ්‍යවන ජීවනෝපාය මාර්ග සැපයීම සඳහා වූ රජයේ වගකීම වැඩි වේ.

2 x 3

(6)

06.

I. 1. නාගරික ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධනය

2. ග්‍රාමිය නාගරික ජන සංක්‍රමණ

3. පරිපාලන සීමා වෙනස් වීම

II. 1. කාර්මීකරණය

2. සංක්‍රමණ

3. ජන සංඛ්‍යාවේ ස්වභාවික වර්ධනය

4. පරිපාලන මායිම් වෙනස් වීම

5. නගර ගෝලියකරණය වීම

6. අධ්‍යාපන, සෞඛ්‍ය වැනි පහසුකම් හි ව්‍යාප්තිය

III. ශ්‍රී ලංකාවේ නාගරීකරණ ක්‍රියාවලිය කෙරේ ග්‍රාමිය - නාගරික සංක්‍රමණ ඍජු දායකත්වයන් සපයයි.

1. රැකියා සඳහා වන සංක්‍රමණය

2. අධ්‍යාපන පහසුකම් මත

3. සෞඛ්‍ය පහසුකම් මත යහපත් ජීවිතයක් අපේක්ෂාවෙන් වන සංක්‍රමන

4. දෛනික යාම් - ඊම් සංචලතාවය ඉහළ යාම
5. පරිපාලන මුල්‍ය, වාණිජ කටයුතු සඳහා වන සංචලනය
6. සේවා අවශ්‍යතා මත සිදුවන සංක්‍රමණය

IV. 1. විරැකියාව
2. මුඩුක්කු හා අනවසර ඉදිකිරීම්
3. ප්‍රවාහන ගැටළු
4. සංක්‍රමණ හා ඉහළ උපත් අනපාතය නිසා සිඝ්‍ර ජනගහනය වර්ධනයක් සිදු වීම
5. නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොවීම
6. පානීය ජලය සැපයුම් ආශ්‍රිත ගැටළු
7. සොරකම, මිනිමැරීම් වැනි අපරාධ මත් උවදුරු වැනි සාමාජීය ගැටළු ඉස්මතු වීම
8. පාරිසරික ගැටළු (ජල හා වායු දූෂණය)

07.

I. 1. ආර්ථික ගෝලියකරණය
2. සංස්කෘතික ගෝලියකරණය
3. දේශපාලනික ගෝලියකරණය
4. තාක්‍ෂණික ගෝලියකරණය
5. සමාජය ගෝලියකරණය
6. පාරිසරික ගෝලියකරණය

II. 1. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණිය
2. ප්‍රවාහනය
3. බහුජාතික සමාගම්
4. මානව සංචලනය

**1. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණිය**

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වේගවත් දියුණුව ගෝලියකරණය විශාල බලපෑමක් එල්ලකර තිබීම
- රේඩියෝව, රූපවාහිනිය පරිඝණකය, චන්ද්‍රිකා, හා වෙනත් විද්‍යුත් උපකරණ මේ සඳහා විශාල දායකත්වයක් සපයා ඇත.
- තොරතුරු වේගවත්ව සැකසීමේ හැකියාවන් විශාල තොරතුරු සම්භාරයක් ඉතා කුඩා අවකාශයක තැන්පත් කිරීමේ හැකියාවන් ලැබීම
- නොමිලේ ලබා දෙන හා මුදල් ගෙවා ලබා ගත හැකි විවිධ මෘදුකාංග මාර්ගගත ආධාර උපදෙස් පරිගණක ශබ්ද කොටස් ආදිය ලබාගත හැකි විට.

- අන්තර්ජාලයට අමතරව GIS, GPS හරහා තොරතුරු ලබා ගැනීමට සකස් කිරීමට, බෙදා හැරීමට හැකි වීම.
- භාණ්ඩ හා සේවා අලෙවි කිරීමට, වෙළඳ දැනවීම් ප්‍රචාරයට වෙළඳ පර්යේෂන සැකසීමට ව්‍යාපාරික ලොව තුළ හැකි වීම

(E- Banking, E - Medicine, E - Mail, Ikman.lk, Al Express)

**2. බහුජාතික සමාගම්**

- ප්‍රධාන මව් සමගම තව මව් රටතුළ තිබියදී වෙනත් රටවල ශාඛා පිහිටුවා ගනිමින් ඒවා අතර සම්බන්ධීකරණය මව් සමාගම මඟින් පාලනය වන සමාගම් වේ.
- මෙම සාමගාම්වල ව්‍යාපාර වෙනත් රටවල ව්‍යාප්ත කිරීම සඳහා මුදල් ආයෝජනය කරන අතර ඒවා සෘජු විදේශිය ආයෝජන ලෙස නම් කෙරේ.
- ලෝකයේ බොහෝ බහුජාතික සමාගම් නිසා ගෝලියකරණයට දායකත්වයක් සැපසීම
- නව නිෂ්පාදන, තාක්ෂණික පැවරීම, යටිකළ පහසුකම් දියුණු කිරීම වේගවත් තොරතුරු ප්‍රචාරන නිසා මෙම සමාගම්වල ක්‍රියාකාරිත්වය පුළුල් වී තිබීම.

**3. මානව සංචලනය**

- ප්‍රාදේශිය හා ජාත්‍යන්තර වශයෙන් සිදුවන සංක්‍රමණයයි. රැකියා, අධ්‍යාපනය, ව්‍යාපාරික කටයුතු, ආගමික හා වෙනත් අවශ්‍යතා සඳහා මානව සංචලනය ඇති වේ.
- ගෝලියකරණය තුල ලෝකය විවෘතව පවතින බැවින් තොරතුරු සන්නිවේදනයේ දියුණුව නිසා ලෝකය පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීමේ පහසුව.
- මානව සංචලනය නිසා සමාජීය හා අවකශිය වශයෙන් පවත්වන පරතරය අඩු වීම.
- අධ්‍යාපනික අවස්ථා පුළුල් වීම
- තාක්‍ෂණික දැනුම හුවමාරු කර ගැනීමට පහසු වීම
- ව්‍යවසාකත්වය දැනුම හුවමාරු කර ගැනීමට ඉඩ ප්‍රස්ථා හිමි වීම.

3. ප්‍රවාහනය

- ගෝලියකරණයට ප්‍රවාහනය ඉතා වැදගත් වේ.
- ලෝකයේ රටවල භාණ්ඩ හා සේවා හුවමාරුව පවත්වාගෙන යාමට ප්‍රවාහනය හා මාර්ග ප්‍රවාහනය වශයෙන්
- ප්‍රවාහනය ඉහළ රටවල ගෝලිකරණය ශක්තිමත්ව ක්‍රියාත්මක වන බව
- ප්‍රවාහනයේ දියුණුව මත රටක් නාරීකරණය වේගත්කරන අතර නාගරීකරනයද ගෝලියකරණයට දායක විමේදි වඩා�� වැදගත් බව.

III.

- කාර්මික රටවල් හා කාර්මික වශයෙන් අඩු දියුණු රටවල් අතර සහ එම රටවල් ඇතුලත ද ආදායම් විෂමතාව වැඩි වී ඇත.
- කාර්මික රටවල පවතින ආකර්ෂණ ප්‍රතිපත්ති සංවර්ධනය වන රටවල අපනයන වෙළපොළට බාධාකාරි ලෙස කටයුතු කිරීම
- සංවර්ධනය වෙමින් පවතින රටවල සංස්කෘතියට බලපෑම් ඇති වීම හා බටහිරකරණයට ගොදුරු වීම.
- විදේශිය ධන ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණේ ක්‍රියා කිරීම නිසා පාරිපරික ගැටළු මතු වීම
- ඔහු ජාතික සමාගම් උපරිම ලාභ අභිමානය පරිදි කටයුතු කරන බැවින් සංවර්ධනය වන රටවල සම්පත් කෙරේ බලපෑම් ඇති කිරීම.

IV.

01. ආර්ථිකයට දායක වන අවස්ථා

- භෝග වගා කිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම
- ගොවින්, ව්‍යාපෘතිකයින්, සේවා සපයන්නන් අතර දැනුම හුමාරුව
- කාලගුණ දේශගුණ තොරතුරු දැන ගැනීම
- කෘෂි සම්පත් සංරක්ෂණයට හා කළමණාකරනයට

02. දේශපාලන අංශයට දායක වීම

- ගෝලිය දැනුම කේද්‍රය කරගෙන ජාතික සංවර්ධනය සඳහා E Sri Lanka ප්‍රතිපත්තිමය රාමුව
- පරිපාලන කටයුතු සකස් කිරීමට
- රාජ්‍ය ආරක්ෂාව සඳහා (R.S, G.P.S හරහා)
- ඡන්ද කටයුතු විවිධ වෙබ් අඩවි හරහා සිදු කිරීම
- විවිධ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා වේ.

03. සංස්කෘතික හා සාමාජිය අංශය සඳහා

- ග්‍රාමිය ප්‍රාදේශියට සාපේක්ෂව නාගරික ප්‍රදේශවල තාක්‍ෂණික උපාංග භාවිතය වැඩි වීම.
- සමාජයේ විවිධ ක්ෂේත්‍ර තොරතුරු තාක්ෂණය භාවිතයට ගැනීම (ගංගා නිර්මාණ, ඇඳුම් පැළඳුම්, ආහාර පාන)
- භාෂා දැනුම වර්ධනයට වෙබ් අඩවි රැසක් බිහි වීම
- ඇඳුම් පැළඳුම් විලාසිතා ක්ෂේත්‍රයේ වෙබ් අඩවි පාඨමාලා හා මෘදුකාංග හඳුනාගත හැක

- ස්වාභාවික උපද්‍රව වලින් දැනුවත් කිරීමට තොරතුරු බෙදා ගැනීමට
- පුද්ගලික සම්බන්ධතා වර්ධනයට
- සමාජීය නවීකරණයට

08.

I. - 1960 දශකයේ සං.වර්ධ.ප. රටවල් ඇතුළු ලෝක කෘෂිකර්මයෙහි ආහාර ධාන්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෘෂිකාර්මික තාක්ෂණයෙන් ඇති කරන ලද වෙනස්කම්ය.

- රසායන ද්‍රව්‍ය ජානමය වශයෙන් වෙනස් කළ බීජ වර්ග පදනම් කරගත් කෘෂි කාර්මික මත පදනම් වූවකි.

II. - ලොව ධාන්‍ය අස්වැන්න හා නිෂ්පාදනය ඉහළ යාම

- ආහාර සුරක්ෂිතාව
- ගොවිපළ ආදායම ඉහළ යාම
- නව කෘෂි අර්ථ ක්‍රමයකට පරිවර්තනය වීම
- ස්වභාවික වන වැස්ම ආරක්ෂා වීම

III. - බෝග වර්ග කීපයකට සීමා වීම

- මේ යටතේ දියුණු කළ වැඩි අස්වනු බෝග වර්ග රසායනික පොහොර භාවිතයෙන් තොරව වගා කිරීම අසාර්ථක වීම
- භූමිය හා මිනිස් සෞඛ්‍යය කෙරෙහි අහිතකර බලපෑම්
- රසායනික පොහොර, කෘමිනාශක හා යන්ත්‍ර යුතු භාවිතය සම්ප්‍රදායික ගොවිතැනට වඩා ගොවින්ට වියදම් කාරි වීම
- කාබනික පොහොර භාවිතය අභාවයට යාම
- රැකියා වියුක්තියක් වර්ධනය වීම
- ජෛව විවිධත්වයට හානිකර වීම
- බහුජාතික සමාගම්වල බලපෑමට සංවර්ධනය වේ. මින් පවතා රටවල් ගොදුරු වීම (නව බීජ වර්ග, කෘෂි රසායන)
- සම්ප්‍රදායික බීජ අභාවයට යාම

IV. - ජේනිද්‍රිය කෘෂිකර්මය පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රමයක් වීම

- ජෛව විවිධත්වය වර්ධනය කරයි
- ජේන්ද්‍රය යෙදවුම් මත නඩත්තු වීම නිසා පස සාරවත් කර ශාක සත්ත්ව පද්ධති පොෂණය කිරීම
- තිරසාර වූ ගොවිතැන් ක්‍රමයකි පස සුරකියි
- රසායනික ද්‍රව්‍යවලින් තොර ආහාර පර්යේෂණය තුළ හැකි වීම නිසා ලෙඩ රෝගවලින් ආරක්ෂා කිරීම
- ස්වභාවිකතවය ආරක්ෂා වීම

- ජල මූලාශ්‍ර හා ජලය ආරක්ෂා වේ
- ජානමය වශයෙන් වෙනස් කළ බෝග වෙනුවට සාම්ප්‍රදායික බෝග නැවත පරිහරණයට පැමිනේ.